# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,303 — 1965 ජනවාරි 26 වැනි අඟහරුවාද — 1965.1.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# III වැනි කොටස—ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත**
**( 460 වැනි පරිච්ඡේදය )**

**38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව**

1965 අංක 43 දරණ ආඥාව

යොමු අංකය : ජේ. 64/65 එල් 181 ව්ඊ
ඇල්ඩ්/ඕ/122

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වේලාතන්තිරි ගුරුන්නාන්සේලාගේ කරුණාරත්න වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

වී. ටී. ජී. කරුණාරත්න,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 ජනවාරි මස 25 ද.

### උපලේඛනය

| I<br>ඉඩම්අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| මහනුවර දිස්ත්‍රික්කයේ උප දිසාපති | i මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කහටපිටිය ගම්මුලාදෑනි කොට්ඨාශයේ, උනම්බුව ගමේ පිහිටි සම්පූර්ණ ප්‍රමාණය අක්කර 40, රූ. 0, පර්. 0 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ එකට යාබදව පිහිටි ගල්කැල්ල, කිතුල්ගොල්ල, මේසයැවත්ත, මැදපිටිය කැලේ, අලවතුපිටිය, එගොඩවත්ත නොහොත් රොබියන්ගොඩවත්ත, ඉනිකැමයැ හේන, විලියොන්හේන, රබර් කැල්ල සහ කුඩුගල නමැති ඉඩම් කැබැලි දහය :— |

උතුරට : අඹහැර හිමිකම් කියන හප්පැන්නැහේන, ටී. බී. උඩුවැරැල්ල හිමිකම් කියන ඔපිසරගේහේන, කේ. ඇම්. මැද්දුමබණ්ඩා හිමිකම් කියන මුගතිවලහේන, ඩී. ඇම්. පුංචිබණ්ඩා සහ තවත් අය හිමිකම් කියන උඩවත්තේ හේන, ඇස්. ඇම්. බිසෝමැණිකේ හා ඇගේ දරුවන් හිමිකම් කියන මේසයැවත්තේ ඉතිරි කොටස, එච්. ඇම්. අප්පුහාමි මහතා හිමිකම් කියන ඉඩම, ආර්. බී. හේරත් මහත්මිය හිමිකම් කියන අලවතුපිටිය;
නැගෙනහිරට : කේ. බී. හේරත් හිමිකම් කියන අලවතුපිටියේ ඉතිරි කොටස හා උඩුවැරැල්ලට යන ගම් සභා පාර ;
දකුණට : ටී. බී. කැප්පෙටිපොල සහ තවත් අය හිමිකම් කියන මෝලාදෙනියේ කුඹුර පොරුදෙනිය කුඹුරු හා උඩදෙනිය කුඹුර, ආර්. බී. හේරත් මහත්මී සහ ටී. බී. කැප්පෙටිපොල හිමිකම් කියන වලව්වේ වත්ත, ඊ. ඇම්. එච්. බණ්ඩා හිමිකම් කියන පිංචිලැවත්ත, ටී. බී. අලහකෝන් මහතා හිමිකම් කියන කොහොඩාවත්ත, උනම්බුව-නාගනහින්න ගම් සභා පාරේ කොටසක් ;
බස්නාහිරට : ඊ. ඇම්. ලොකුබණ්ඩා හිමිකම් කියන කුඩුගලේ හේනේ ඉතිරි කොටස, පී. බී. අළුදෙනිය මහතා සහ තවත් අය හිමිකම් කියන ගල්බොක්කේ නිලමේගේ හේන නොහොත් ඉල්ලවතුර හේන, අනුලාවතී උඩුවැරැල්ල හිමිකම් කියන තවලම්තැන්නේ වත්ත.

ii. මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කහටපිටිය ගම් මුලාදෑනි කොට්ඨාශයේ, උනම්බුව ගමේ පිහිටි අලවතුපිටිය නමැති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 3 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට : කේ. බී. හේරත් හිමිකම් කියන අලවතුපිටියේ කොටස ;
නැගෙනහිරට : ටී. බී. කැප්පෙටිපොල, එච්. ඇම්. අප්පුහාමි සහ තවත් අය හිමිකම් කියන පද්දෙනියේ කුඹුර හා නාරංග කුඹුර;
දකුණට : පී. බී. හේරත් හිමිකම් කියන ඉඩම ;
බස්නාහිරට : ගම්පොල–මහනුවර ප්‍රසිද්ධ පාරේ සිට උනම්බුවට යන ගම් සභා පාරේ කොටසක් ද, එම ප්‍රසිද්ධ පාරෙන් උඩුවැරැල්ලට යන පාරේ කොටසක් ද වේ.

iii. මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කහටපිටිය ගම් මුලාදෑනි කොට්ඨාශයේ උඩම්බුව ගමේ පිහිටි නාරංගහේන නමැති, ප්‍රමාණයෙන් අ. 10, රූ. 3, පර්. 8 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට : උඩම්බුවේ සිට ගම්පොල-නුවර ප්‍රසිද්ධ පාරට වැටෙන ගම් සභා පාර ;
නැගෙනහිරට : උනම්බුවේ සිට ගම්පොල–නුවර ප්‍රසිද්ධ පාරට වැටෙන ගම් සභා පාර ;
දකුණට : ලොකුමැණිකේ හේරත්ගේ දරුවෙකු හිමිකම් කියන නාරංගහේනේ ඉතිරි කොටස හා ගම්පොල සහිරා විද්‍යාලයට අයත් පින්වත්ත ;
බස්නාහිරට : දෙන් සයිමන් මහතුන් හිමිකම් කියන හුණුගලවත්ත සහ නාරංගහවෙල දෙමැද සහ නාරංගහේන කියා භාවිතා කරන ඉඩම් කට්ටිය.

1–1133

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

49——ආර් 3745—1,625 (65/1)